# LKI UPDATE

programmes@lki.lk

ජනවාරි - ජූලි 2024

https://lki.lk/

## LKI සන්නාම ව්‍යාපෘති

- **13/01/2024:** LKI හි විධායක අධ්‍යක්ෂ, ‘ශ්‍රී ලංකාව ගමනාන්තයක් ලෙස: පුරාතනයේ සිට නූතනත්වය දක්වා’ පිළිබඳ විද්වත් මණ්ඩලයේ මුලසුන හොබවයි.
- **01/02/2024:** LKI විසින් ‘ශ්‍රී ලංකාව සහ ඕස්ට්‍රේලියාව අතර සබඳතා ශක්තිමත් කිරීම’ පිළිබඳ විශේෂඥ වටමේස සාකච්ඡාව පවත්වයි.
- **21/02/2024:** “නොබැඳි ප්‍රතිපත්තිය යනු ස්වෛරී තීරණ ගැනීමට කඳවුරකට එක්වීමට බලපෑම් සිදුනොකිරීම බව” තුන්වන LKI විදේශ ප්‍රතිපත්ති සංසදයේදී විදේශ කටයුතු අමාත්‍ය අලි සබ්රි පවසයි.
- **21/02/2024:** තුන්වන LKI විදේශ ප්‍රතිපත්ති සංසදය-‘ධ්‍රැවීකරණය වූ ලෝකයක නොබැඳි බව තක්සේරු කිරීම’.
- **11/07/2024:** සිව්වන LKI විදේශ ප්‍රතිපත්ති සංසදය-‘ශ්‍රී ලංකාවේ ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ප්‍රතිඵල සහ ආර්ථික රාජ්‍යතාන්ත්‍රිකත්වය සහ විදේශ ප්‍රතිපත්ති කෙරෙහි එහි බලපෑම’.












## LKI පර්යේෂණ අධ්‍යයනයන්

- **ජූනි 2024:** ශ්‍රී ලංකා-ඕස්ට්‍රේලියා සබඳතා ශක්තිමත් කිරීම

LKI හි පර්යේෂණ සීමාවාසික **ඉෂාරා තිලකරත්න**, සහ පර්යේෂණ සාමාජික (ගෝලීය ආර්ථිකය) **මයිකල් අයිවිසන්**, ශ්‍රී ලංකා-ඕස්ට්‍රේලියා ද්විපාර්ශ්වික සබඳතාවයේ දේශපාලන, ආර්ථික සහ උපාය මාර්ගික අංශ පිළිබඳ තක්සේරුවක් ඉදිරිපත් කරන අතර දෙරටේ සබඳතා ශක්තිමත් කිරීම සඳහා නිර්දේශ සපයයි.

- **ජූනි 2024:** ආර්ථික ඒකාබද්ධතාවය සඳහා ශ්‍රී ලංකාවේ ඉදිරිමාවත: කලාපීය විස්තීරණ ආර්ථික හවුල්කාරිත්වය (RCEP) හරහා අතීත උත්සාහයන් සහ අපේක්ෂාවන් තක්සේරු කිරීම

LKI හි පර්යේෂණ සහකාර **මිහින් පෙරේරා**, ශ්‍රී ලංකාව RCEP වෙත ප්‍රවේශ වීමේ අපේක්ෂාවන් සහ RCEP සාමාජිකත්වය සමස්ත රටට බලපාන ආකාරය විශ්ලේෂණය කරයි. ශ්‍රී ලංකාව සිය ආර්ථික අභිලාෂයන් ඵලදායී ලෙස සාක්ෂාත් කර ගැනීමේ මාවතේ කලාපීය ඒකාග්‍රතාවයේ ප්‍රයත්නයන් ඉදිරියට ගෙන යාමට මෙම හවුල්කාරිත්වය උපයෝගී කර ගත හැකි ආකාරය ද මෙහිදී ගවේෂණය කරයි.

- **ජූලි 2024:** එක්සත් ජාතීන්ගේ සාම සාධක හමුදාවේ ශ්‍රී ලංකාවේ භූමිකාව: අන්‍යෝන්‍ය වශයෙන් වාසිදායක ක්‍රියාවලියක් සඳහා ඇති හැකියාවන් සහ අභියෝග

LKI හි පර්යේෂණ සහකාර **දුලනක ජයසිංහ**, එක්සත් ජාතීන්ගේ සාම සාධක මෙහෙයුම් සඳහා ශ්‍රී ලංකාවේ අඛණ්ඩ සහභාගීත්වය සහ මෙම අභියෝගාත්මක මෙහෙයුම් වලදී ශ්‍රී ලංකාවේ දායකත්වය විශ්ලේෂණය කරන අතර එය පුළුල් කිරීමේ හැකියාව සහ ප්‍රතිලාභ ද ගවේෂණය කරයි.

## LKI සිදුවීම් සහ සහයෝගීතා

- **28/03/2024:** 'ආපදා අවදානම කළමනාකරණය වැඩි දියුණු කිරීම සහ දේශගුණික ප්‍රතිචාරය: IORA සාමාජික රටවල ජපානය සහ ඕස්ට්‍රේලියාවේ සහයෝගී උත්සාහයන්' පිළිබඳ විද්වත් මණ්ඩල සාකච්ඡාව, ශ්‍රී ලංකාවේ ජපාන තානාපති කාර්යාලය සහ ඕස්ට්‍රේලියානු මහ කොමසාරිස් කාර්යාලයේ සහයෝගීතාවයෙන් පවත්වන ලදි.
- **09/04/2024:** LKI විසින් 'BIMSTEC හරහා කලාපීය සහයෝගීතාව' යන මාතෘකාව යටතේ BIMSTEC මහලේකම්වරයා ගේ සහභාගීත්වයෙන් අන්තර් ක්‍රියාකාරී සැසිවාරය පවත්වයි.
- **23/05/2024:** LKI විසින් වෙසක් උත්සවය සමරයි.
- **06/06/2024:** LKI විසින් ඕස්ට්‍රේලියානු ජාතික විශ්ව විද්‍යාලය (ANU) සහ ශ්‍රී ලංකාවේ ඕස්ට්‍රේලියානු මහ කොමසාරිස් කාර්යාලය සමඟ එක්ව 'ශ්‍රී ලංකාවේ සමුද්‍රීය වසම් දැනුවත්භාවය (MDA) ගොඩනැගීම' පිළිබඳ වැඩමුළුවක් පවත්වයි.
- **13/06/2024:** LKI විසින් SAARC හි මහලේකම් සමග විශේෂඥ වටමේස සාකච්ඡාවක් පවත්වයි.
- **25/06/2024:** LKI විසින් 'BIMSTEC හි අනාගත දිශානතිය' පිළිබඳ කීර්තිමත් පුද්ගලයින්ගේ කණ්ඩායම සමඟ සාකච්ඡාවකට සම්බන්ධ වේ.
- **09/07/2024:** BIMSTEC හී හය වැනි Network of Policy Think Tanks (BNPTT) රැස්වීමට LKI  සහභාගී වේ.







## LKI හමුවීම් සහ සහභාගීවීම්

- **24/01/2024:** ජාත්‍යන්තර සාමය සඳහා වන Carnegie Endowment හි සාමාජික Darshana M. Baruah මහතා LKI වෙත පැමිණේ.
- **30/01/2024:** එක්සත් ජනපද කොන්ග්‍රස් පර්යේෂණ සේවා (CRS)  සාමාජිකයන් LKI වෙත පැමිණේ.
- **06/02/2024:** ශ්‍රී ලංකාවේ ස්ලෝවේනියා ජනරජයේ තානාපතිනී අතිගරු Mateja Vodeb Ghosh මහත්මිය LKI වෙත පැමිණේ.
- **06/02/2024:** LKI හි දුලනක ජයසිංහ විසින් කොග්ගල, 'Rhythms of Paradise'ට සමගාමීව පැවති විද්වත් සාකච්ඡාව මෙහෙයවයි.
- **16/02/2024:** ඕස්ට්‍රේලියානු-ඉන්දියා ආයතනයේ Alyssa Gutierrez මහත්මිය හමුවීම.
- **22/02/2024:** ආසියාවේ අන්තර්ක්‍රියා සහ විශ්වාසය ගොඩනැගීමේ පියවර පිළිබඳ සමුළුවේ (CICA) මහ ලේකම් Kairat Sarybay මහතා LKI වෙත පැමිණේ.
- **26/02/2024:** පකිස්ථානයේ Riphah ජාත්‍යන්තර විශ්ව විද්‍යාලයේ නියෝජිත කණ්ඩායම  LKI වෙත පැමිණේ.
- **18/03/2024:** තායිලන්ත අග්‍රාමාත්‍ය කාර්යාලයේ නියෝජිත පිරිස LKI වෙත පැමිණේ.
- **22/03/2024:** ඕස්ට්‍රේලියානු ජාතික විශ්ව විද්‍යාලයේ (ANU) ජ්‍යෙෂ්ඨ පර්යේෂණ සාමාජික, ආචාර්ය David Brewster මහතා LKI වෙත පැමිණේ.
- **01/04/2024:** ශ්‍රී ලංකා ජාත්‍යන්තර වාණිජ මණ්ඩලය (ICC) සහ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ (BOI) සහයෝගීතාවයෙන්, 'නිදහස් වෙළඳ ගිවිසුම් මාවත: ශ්‍රී ලංකාවේ අපනයන සහ සෘජු විදේශ ආයෝජන විභවය ගවේෂණය කිරීම' යන මාතෘකාව යටතේ සංවිධානය කරන ලද මාර්ගගත සම්මන්ත්‍රණය සඳහා තානාපති රවිනාථ ආර්‍යසිංහ සහභාගී වේ.
- **03/04/2024:** LKI හි මයිකල් අයිවිසන් නේපාලයේ කත්මන්ඩු හි පැවති 'කලාපීය දේශගුණික මූල්‍ය සමුළුවේදී' සිය පර්යේෂණ අධ්‍යයනය ඉදිරිපත් කරයි.
- **09/04/2024:** LKI විසින් BIMSTEC මහලේකම් Indra Mani Pandey මහතා පිළිගනී.
- **07/05/2024:** පකිස්ථානයේ ජාතික ආරක්ෂක විශ්ව විද්‍යාලයේ (NDU) නියෝජිත පිරිසක් LKI වෙත පැමිණේ.
- **08/05/2024**: LKI විසින් නෝර්වේහි Agder විශ්ව විද්‍යාලයේ සිසුන් පිළිගනී.
- **21/05/2024**: තානාපති රවිනාථ ආර්‍යසිංහ ජාතික ආරක්ෂක අධ්‍යයන ආයතනයේ (INSS) සංචාරයක යෙදෙයි.
- **05/06/2024:** ඕස්ට්‍රේලියානු ක්‍රමෝපාය අධ්‍යයන විශේෂඥයින් LKI වෙත පැමිණේ.
- **06/06/2024:** ශ්‍රී ලංකා නාවික හමුදාපති වයිස් අද්මිරාල් ප්‍රියන්ත පෙරේරා මහතා LKI වෙත පැමිණේ.
- **13/06/2024:** LKI විසින් SAARC මහලේකම්  Md. Golam Sarwar මහතා පිළිගනී.
- **02/07/2024:** චීන කොමියුනිස්ට් පක්ෂයේ මධ්‍යම කාරක සභාවේ ජාත්‍යන්තර දෙපාර්තමේන්තුවේ නියෝජිත පිරිසක් LKI වෙත පැමිණේ.
- **05/07/2024:** ශ්‍රී ලංකාවේ කොරියානු ජනරජයේ තානාපතිනී අතිගරු Miyon Lee මහත්මිය හමුවීම.
- **09/07/2024:** ලැට්වියා ජනරජයේ විදේශ කටයුතු අමාත්‍යාංශයේ නියෝජිතයින් LKI වෙත පැමිණේ.